# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,109 - 2019 පෙබරවාරි මස 01 වැනි සිකුරාදා - 2019.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 290 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 306 |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 පෙබරවාරි මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 පෙබරවාරි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## පුත්තලම ප්‍රාදේශීය සභාව

### වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පුත්තලම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

පුත්තලම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත විස්තර සඳහන් ප්‍රාථමික ශිල්පීය නොවන සහ ප්‍රාථමික ශිල්පීය ගණයේ තනතුරු සඳහා වයඹ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2008.11.19 හා 2009.05.12 යන දිනවල අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති පුත්තලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වසර 03කට වැඩි කාලයක් ස්ථිර පදිංචි ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | සේවක ගණය | බඳවා ගන්නා ශ්‍රේණිය | බඳවා ගන්නා පදනම | බඳවා ගන්නා සංඛ්‍යාව | වැටුප් ක්‍රමය |
|---|---|---|---|---|---|
| රියදුරු | ප්‍රාථමික ශිල්පීය (PL 3) | III | ස්ථිර | 1 | රු. 25,790 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,990.00 |
| කාර්යාල කාර්ය සහායක | ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) | III | ස්ථිර | 2 | රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410.00 |
| සෞඛ්‍ය කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) | III | ස්ථිර | 1 | රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410.00 |

**රියදුරු තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් :-**

*අධ්‍යාපන සුදුසුකම් :*

- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් විෂයන් දෙකකට සම්මාන සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම (වෛකල්පිත විෂයන් හැර) අවම වශයෙන් එක් වතාවක දී විෂයන් 05ක් සමත් වී තිබිය යුතු ය.

- වාහන රියදුරෙකු ලෙස වසර 03ක පළපුරුද්දක් අවශ්‍ය වේ.

- තාරබර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන, බර ටේලර් සහ මගීන් 32කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු ය. ( A පන්තියේ රියදුරු බලපත්‍රයක්)

කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් -

- අධ්‍යාපන සුදුසුකම් :

  අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයන් 02ක් වත් සමත් වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයන් හැර)

**සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් -**

- අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයන් 02ක් වත් සමත් වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයන් හැර)

*ඉහත සියළු තනතුරු සඳහා අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

i. සියලු අයදුම්කරුවන් වයස අවුරුදු 18-45ත් අතර විය යුතු ය. (දැනටමත් වයඹ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරුවල සේවය කරන අයට උපරිම වයස් සීමාව බල නොපැවැත් වේ.)

ii. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය.

iii. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් විය යුතු ය.

iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතු ය.

v. පුත්තලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03ක පදිංචිකරුවෙකු බව සනාථ කිරීමේ ග්‍රාම සේවා සහතිකය ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව ඉදිරිපත් කළ යුතු ය.

vi. දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් ඔහු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියළු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.

vii. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය පුත්තලම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක සහ අදාළ වන පරිදි වෘත්තීය ප්‍රවීණතාව තහවුරු කරගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ. දැනටමත් ස්ථිර/අනියම්/ආදේශක/ගිවිසුම් මත සභාවේ සේවය කරන සේවකයින් සඳහා ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ. මූලික සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

ඉහත ස්ථිර තනතුරු සඳහා තෝරා ගන්නා අයදුම්කරුවන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් විය යුතු වේ. එම කාලය තුළ සිය රාජකාරී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ. චක්‍රලේඛ විධිවිධාන පරිදි වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

*අයදුම්පත් එවිය යුතු පිළිවෙල :*

සියළුම අයදුම්කරුවන් මෙහි පහතින් ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කරගත් අයදුම්පත් 2019.02.15 දිනට පෙර ලැබෙන සේ "ලේකම්, පුත්තලම ප්‍රාදේශීය සභාව, මදුරන්කුලිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙරවළේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු ය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු වේ.

I. උප්පැන්න සහතිකය
II. ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත
III. අධ්‍යාපන සහතික
IV. ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා හා පළපුරුද්ද පිළිබඳ සහතිකය
V. අදාළ වන පරිදි රියැදුරු බලපත්‍රය
VI. ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය
VII. අදාළ වන පරිදි රියැදුරු වශයෙන් වසර 03කට වැඩි පළපුරුද්ද පිළිබඳ සේවා සහිතකය
VIII. ඔබ දැනට යම් ආයතනයක සේවයේ නියුක්ත වන්නේ නම් එම ආයතනයෙන් ලබාගත් සේවා සහතිකයක්

එච්. ජේ. එම්. එම්. එස්. ජයසුන්දර,
ලේකම්,
පුත්තලම ප්‍රාදේශීය සභාව,
මදුරන්කුලිය.

2019 පෙබරවාරි මස 01 වැනි දින,
පුත්තලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***පුත්තලම ප්‍රාදේශීය සභාව***

*වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පුරප්පාඩු වී ඇති ..................................... තනතුර සඳහා බඳවා ගැනීම*

කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි.

01. මුලකුරු සමග නම :————————————————.
(සිංහලෙන්/ ඉංග්‍රීසියෙන්)

02. මුලකුරුවලින් හැඳින්වෙන නම :————————————————.
(සිංහලෙන්/ඉංග්‍රීසියෙන්)

03. ලිපිනය -
(i) පෞද්ගලික ලිපිනය :————————————————.
(ii) රාජකාරී ලිපිනය :————————————————.

04. දුරකථන අංකය :.
(i) පෞද්ගලික දුරකථන අංකය :————————————————.
(ii) රාජකාරී දුරකථන අංකය:————————————————.

05. උපන් දිනය :————————————————.
2018.12.01 දිනට වයසය
අවුරුදු :————— මාස :————— දින :—————

06. ජාතික හැඳුනුම්පත් අංකය :————————————————.

07. ස්ත්‍රී/පුරුෂ භාවය :————————————————.

08. අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය (ප්‍රථම/දෙවන/තෙවන)

විභාග අංකය :————— වර්ෂය :—————

මාධ්‍යය :—————

| | *සමත් වූ විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| (i) | ............... | ............... |
| (ii) | ............... | ............... |
| (iii) | ............... | ............... |
| (iv) | ............... | ............... |
| (v) | ............... | ............... |
| (vi) | ............... | ............... |
| (vii) | ............... | ............... |
| (viii) | ............... | ............... |
| (ix) | ............... | ............... |
| (x) | ............... | ............... |

අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය :

විභාග අංකය:————— වර්ෂය:—————

මාධ්‍යය:—————

| | සමත් වූ විෂය | ශ්‍රේණිය |
|---|---|---|
| (i) | | |
| (ii) | | |
| (iii) | | |
| (iv) | | |

09. වෘත්තීය සුදුසුකම්/පළපුරුද්ද :

10. දැනට යම් තනතුරක් දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර :

(i) ආයතනයේ නම :—————————————.

(ii) තනතුර හා ශ්‍රේණිය :—————————————.

(iii) පත් වූ දිනය :—————————————.

(iv) සේවා සහතිකය :—————————————.

11. මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති සියලු තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ද මෙහි සපයා ඇති යම් තොරතුරක් වැරදි හෝ අසත්‍ය බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මා දනිමි.

——————;
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

12. ආයතන ප්‍රධානියාගේ සහතිකය :
*(දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා)*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ................................................................... මහතා/මහත්මිය .......................... වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම සහ හැසිරීම සතුටුදායක බවත්, ඉහත 01 සිට 10 දක්වා ශීර්ෂවල සඳහන්කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පෞද්ගලිකවම පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත්, 2019 .......................... මස .......................... වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

——————————;
ආයතන ප්‍රධානියාගේ/ ඔහුගේ බලයලත්
නිලධාරියාගේ අත්සන හා මුද්‍රාව.

දිනය :——————.

02-288

## හොරණ නගර සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

හොරණ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තොරතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (හොරණ නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් තාවකාලික, අනියම් හා ආදේශ සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.)

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය රා. ප. ච. අංක 03/2016 අනුව* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | ස්ථානභාර නිලධාරි (මෙහෙයුම්/ගිනි නිවාරණ/පුහුණු) | 01 | RS - 4-2016<br>රු. 37,030 - 24x660 - රු. 52,870 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල /දෙමළ, ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සාමාර්ථ ලබා තිබිය යුතු අතර, ඉන් විෂයයන් 05ක් එක් වරක දී සමත් වී තිබීම;<br>*හෝ*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල /දෙමළ, ගණිතය, ඉංග්‍රීසි, රසායනය විද්‍යාව හා තවත් විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සාමාර්ථ ලබා තිබිය යුතු අතර, ඉන් විෂයයන් 05ක් එක් වරකදී සමත් වී තිබීම;<br>*හා*<br>ලන්ඩනයේ ගිනි ඉංජිනේරු ආයතනයේ ප්‍රාථමික පරීක්ෂණ සහතිකය ලබා තිබිය යුතු ය;<br>*හා*<br>වෘත්තීය ගිනි නිවන හමුදාවක/සේවාවක ගිනි නිවීමේ කටයුතු පිළිබඳ අවුරුදු 10කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, අවු. 05ක සතුටුදායක සේවයක් තිබිය යුතු ය;<br>*හා*<br>බාහිර අයදුම්කරුවන් බස්නාහිර පළාත තුළ වසර 03ක ස්ථිර පදිංචියක් තිබිය යුතු ය. |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය රා. ප. ච. අංක 03/2016 අනුව* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 02. | ක්‍රීඩාභූමි පරිපාලක | 01 | MN -1-2016 27,140 - 10x300 - 11x350 - 10x495 - 10x660 - රු. 45,540.00 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල /දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් 02 සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් 06කින් සමත් වී තිබීම.<br>හා<br>අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් අවම වශයෙන් විෂයයන් 01 (පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. |
| 03 | සෞඛ්‍ය පරිපාලක | 01 | MN -1-2016 27,140 - 10x300 - 11x350 - 10x495 - 10x660 - 45,540.00 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල /දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් 02 සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් 06කින් සමත් වී තිබීම.<br>හා<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් අවම වශයෙන් විෂයන් 01 (පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. |
| 04 | කාර්යාල කාර්ය සහායක | 02 | PL-1-2016 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - 36,140.00<br>(වසර 03ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය. ) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06ක් සමත් වී තිබීම. (මින් විෂයන් 05ක් එකවර සමත් විය යුතු ය.) |
| 05 | මුරකරු | 03 | PL-1-2016 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,140.00<br>(වසර 03ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය. ) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම. (මින් විෂයන් 05ක් එකවර සමත් විය යුතු ය.) |
| 06 | සෞඛ්‍ය කම්කරු | 07 | PL -1- 2016 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,140.00 | 08 වන ශ්‍රේණිය/09 වසර සමත් වී තිබිය යුතු ය. |

02. *බඳවා ගැනීමේ ක්‍රමය :*

- ස්ථානභාර නිලධාරි (මෙහෙයුම්/ ගිනි නිවාරණ/ පුහුණු)/ සෞඛ්‍ය පරිපාලක හා ක්‍රීඩා භූමි පරිපාලක තනතුරු සඳහා ලිඛිත පරීක්ෂණයක් මගින් ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, ඒ මගින් සුදුස්සන් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

- කා. කා. ස./ මුරකරු/ සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම මගින් සුදුස්සන් බඳවා ගනු ලැබේ.

03. *බඳවා ගැනීමේ කොන්දේසි :*

I. අයදුම්කරුවන් ශ්‍රී ලංකික පුරවැසියෙකු විය යුතු ය.
II. අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.
III. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට,

- ස්ථානභාර නිලධාරි (මෙහෙයුම්/ගිනි නිවාරණ/පුහුණු) සඳහා වයස අවුරුදු 25 නොඅඩු විය යුතු අතර, වයස අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.
- සෞඛ්‍ය පරිපාලක/ ක්‍රීඩාභූමි පරිපාලක තනතුරු සඳහා වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30ට නොවැඩි විය යුතු අතර,
- කා. කා. ස./ මුරකරු/ සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, වයස අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

IV. අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබුවෙකු හෝ රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවයෙන් පහ කරනු ලැබුවෙකු නොවිය යුතු ය.

04. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

I. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.
II. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
III. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූල විය යුතු ය.
IV. වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.

05. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලට ද, බස්නාහිර පළාතේ පළාත් සභාව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා හොරණ නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝග වලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

06. *අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර "ලේකම්, හොරණ නගර සභාව, හොරණ." යන ලිපිනයට 2019.02.20 දිනට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන ලද තනතුර සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ අතරතුර දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම හෝ නිවේදනය අවලංගු කිරීමේ බලතල හොරණ නගර සභාවේ ලේකම් සතු ය.

වයි. පී. මහේන්ද්‍ර,
ලේකම්,
හොරණ නගර සභාව.

2019 ජනවාරි මස 23 වැනි දින,
හොරණ නගර සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*හොරණ නගර සභාව*

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ............................ තනතුරු සඳහා අයදුම්පත්‍රය*

01. (i) මුලකුරු සමග නම:——————————————.

(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම :——————————————.

02. ස්ථිර ලිපිනය :——————————————.

03. දුරකථන අංකය :——————————————.

04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————.

05. ජාතික හැඳුනුම්පත් අංකය:——————————————.

06. ස්ත්‍රී/පුරුෂභාවය :——————————. විවාහක/අවිවාහක බව :———————.

07. (i) උපන් දිනය :——————————————.

(ii) 2019.02.20 දිනට වයස ඃ

අවුරුදු :—————, මාස :—————, දින :—————.

08. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද එසේ වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද? :——————————————.

09. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :——————————————

10. වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :——————————————

11. සේවා පළපුරුද්ද :——————————————

12. වෙනත් සුදුසුකම් :——————————————

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? :——————————————

14. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

02-292

## මාතර ප්‍රාදේශීය සභාව

මාතර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත තනතුරු සඳහා දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කර ලේකම්, ප්‍රාදේශීය සභාව, මාතර යන ලිපිනයට 2019.02.28 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | මාර්ග කම්කරු | 02 | රා.ප.ච. 3/2016 (PL 1 2016) අනුව රු. 24,250 - 250x10- 270x10- 300x10- 330x12- රු. 36,410කි. 2020.01.01 සිට ක්‍රියාත්මක වන අතර ඉහත චක්‍රලේඛයේ උපලේඛන II අනුව වැටුප් හිමි වේ. | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම. |
| 02 | බර යන්ත්‍ර ක්‍රියාකරු | 01 | රා.ප.ච. 3/2016 (PL 1 2016 ) අනුව රු. 25,790 - 270x10 -300x10 -330x10- 350x12- රු. 38,990කි. 2020.01.01 සිට ක්‍රියාත්මක වන අතර ඉහත චක්‍රලේඛයේ උපලේඛන II අනුව වැටුප් හිමි වේ. | අ. පො. ස. (සා. පෙළ) දෙවරකට නොවැඩි වාර ගණනකදී ඕනෑම විෂයයන් 06ක් සමත් වීම. |

03. *පැවරෙන කාර්යභාරය :*

මාර්ග කම්කරු :- ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන ස්ථානවල පවිත්‍රතා කටයුතු නිසි පරිදි ඉටු කිරීම.

බර යන්ත්‍ර ක්‍රියාකරු :- ආයතනයට අයත් වාහන පැදවීම, ධාවන සටහන් පවත්වාගෙන යාම, නඩත්තු හා සේවා කටයුතු සම්බන්ධයෙන් නොපමාව අදාළ නිලධාරීන් දැනුවත් කිරීම.

04. *තනතුරෙහි ස්වභාවය :*

ස්ථිරය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතු වේ.

05. *වෙනත් සුදුසුකම් :*

පිළිගත් ආයතනයක සේවා පළපුරුද්ද, පුහුණුව, වෘත්තීය සුදුසුකම් ලබා ඇති අයට ප්‍රමුඛතාවය හිමි වේ.

තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ටේලර් සහ මගීන් 32ට වැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබිය යුතු ය. (බඳවා ගන්නා දිනට අවම වශයෙන් වසර 3කට පෙර මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කළ බරවාහන බල පත්‍රයක් ලබා තිබිය යුතු ය.) හා ඉහත බලපත්‍රයට අමතරව තනතුරට අදාළ වන යන්ත්‍ර ක්‍රියාකරවීම සම්බන්ධව රජය පිළිගත් ආයතනයකින් (NAITA/ ICTAD පුහුණුව ලැබූ බවට (NVQ 4) මට්ටමට නොඅඩු සනාථ කරන සහතිකය තිබිය යුතු ය.

06. වයස : අයදුම්පත් කැඳවන දිනට වයස අවු. 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතු ය.

07. *වෙනත් :*
අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයන් විය යුතු අතර අයදුම්පත්‍ර කැඳවන අවසාන දිනට මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පූර්වාසන්න වසර 05ක හා අනුගාමී වසර 03ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතු ය.

08. බඳවා ගැනීමේ ක්‍රමය :
අයදුම්පත් කැඳවීමෙන් පසුව සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත බඳවා ගැනේ.

09. ලකුණු දීමේ ක්‍රමවේදය ඃ
මාර්ග කම්කරු

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | 30 |
| පළපුරුද්ද | 10 |
| සභා බල ප්‍රදේශයේ පදිංචිය | 45 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 |

බරවාහන යන්ත්‍ර ක්‍රියාකරු

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - ලකුණු 50
(ii) වෘත්තීය සම්මුඛ පරීක්ෂණය - ලකුණු 50

ලේකම්,
මාතර ප්‍රාදේශීය සභාව.

ආදර්ශ අයදුම්පත්‍රය

**බරවාහන යන්ත්‍ර ක්‍රියාකරු/මාර්ග කම්කරු තනතුර**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

01. මුලකුරු සමග නම :——————————
02. මුලකුරු වලින් හැඳින්වෙන නම :——————————
03. ජාතික හැඳුනුම්පත් අංකය :——————————
04. ස්ථිර පදිංචි ලිපිනය :——————————
05. තැපැල් ලිපිනය :——————————
06. ජාතිය :——————————
07. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————
08. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————
09. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශය :——————————
10. උපන් දිනය :——————————
11. 2019.02.28 වැනි දිනට වයස :——————————
12. අධ්‍යාපන සුදුසුකම් :——————————
13. පළපුරුද්ද :——————————
14. වෙනත් සුදුසුකම්:——————————
15. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවකු කර තිබේ ද? ඃ _____

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සකු කිරීමට හා බඳවා ගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහකිරීමටත් යටත්වන බව හොඳාකාරවම දනිමි.

————————————,
අයදුම්කරුගේ අත්සන.

————————.
දිනය

02-371

## දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

### තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු වලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු | 01 | PL01 | රා. ප. ච. 3/2016 අනුව රු. 24,250- 250 x 10 - 270 x 10 - 300 x 10 - 330 x 12- රු. 36,410 III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම<br>කායික සුදුසුකම් :<br>තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. |
| 02 | මුරකරු | 02 | PL 1 2016 | රා.ප.ච. 3/2016 අනුව රු. 24,250- 250 x 10 - 270 x 10 - 300 x 10 -330 x 12 - රු. 36,410 III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අධ්‍යාපන සුදුසුකම්:<br>අ.පො.ස (සා. පෙ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයන් හය (06) ක් සමත් විය යුතුය. (මින් විෂයන් පහක් (05) ක එකවර සමත්විය යුතුය.)<br>කායික සුදුසුකම් :<br>තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. |

01. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය.
(ii) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(iii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
(iv) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය* - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

සෞඛ්‍ය කම්කරු :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50 |
| තනතුරට අදාලව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මටට්මේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

මුරකරු ඃ

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂය | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | 50 |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :-

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ii) වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ද දායක විය යුතුය.

(iii) පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වන්නේය.

(iv) මෙම බඳවා ගැනීම් ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද රජය හෝ බස්නාහිර පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝග වලට ද අනුකූලය. ඒ අනුව ක්‍රියා කිරීමට සියළුම සේවකයින් බැඳී සිටිය යුතු වේ.

04. *අයදුම්පත් ඉදිරිපත් කරන ආකාරය* ඃ

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත ලියවිලිවල ඡායා පිටපත් සමග 2019.02.26 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ''ලේකම්'' දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව, දොඩන්ගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කල යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලබන අතර, අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

* උප්පැන්න සහතිකය;

* ජාතික හැඳුනුම්පත;

* අධ්‍යාපන සහතිකය;

* තම පදිංචිය සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් අනු අත්සන සහිත ග්‍රාම නිලධාරී සහතිකය;

* මෑතකදී ලබා ගන්නා ලද චරිත සහතික 02 ක් ;

* වෘත්තීය පළපුරුද්ද සහ වෙනත් සුදුසුකම් දක්වෙන සහතික.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

පී. ජී. පී. රුද්‍රිගෝ,  
ලේකම්,  
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව,  
දොඩන්ගොඩ.

2019 ජනවාරි මස 18 වැනි දින,  
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*බස්නාහිර පළාතේ රාජ්‍ය සේවයේ දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ................................ තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. මුලකුරු සමග නම :——————————
02. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————
03. ස්ථිර ලිපිනය :——————————
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————
05. ජාතික හැඳුනුම්පත් අංකය :——————————
06. දුරකථන අංකය :——————————
07. උපන් දිනය: වර්ෂය :———— මාසය :———— දිනය:————
08. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :———— මාස :———— දින :————
09. විවාහක/අවිවාහක බව:——————————
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? යන වග:——————————
11. අධ්‍යාපන සුදුසුකම්:——————————
12. වෙනත් සුදුසුකම්:——————————
13. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් මෙම කොටස සම්පූර්ණ කරන්න.
    1. දැනට දරන තනතුර:——————————
        i. එම තනතුරට පත් වූ දිනය:——————————
        වර්තමාන සේවා ස්ථානය හා ලිපිනය:——————————

        ii. මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මීට පෙර මා රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවකු හෝ සේවය අතහැර ගිය අයකු හෝ සාපරාධී වරදක් සම්බන්ධයෙන් අධිකරණයක් මගින් වරදකරුවකු වී නොමැති අයකු බවත් මා ඉහත තනතුර සඳහා තෝරා පත් කර ගැනීමට පෙර හෝ පසුව ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට හෝ දඬුවම් ලැබීමට යටත් බවත් දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:————————

(දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවකු නම්) දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා ලවා මෙම කොටස සම්පූර්ණ කරවා ගන්න.

ඉහත අයදුම්කරු වන ........................................... මහතා/මිය/මෙනවිය මෙම ආයතනයේ ................................................. වශයෙන්....................................... දින සිට කටයුතු කරනු ලබයි. ඇයගේ/ඔහුගේ පත්වීම........................................... දින සිට ස්ථිර කර ඇත. අයදුම්කරු මීට පෙර විනයානුකූල දඬුවම් ලබා ඇති/නැති අතර ඇයට/ඔහුට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමක් මේ වන විට සිදු කරමින්/නොකරමින් නොපවතී. මෙම තනතුරට තෝරා පත් කරනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් මුදා හැරිය හැකිය./නොහැකිය. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ආයතනික ප්‍රධානියාගේ අත්සන.

දිනය:————————.

02-301

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත් සභාව තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අවම අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 1 | රියදුරු | 02 | රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් ඕනෑම විෂයයන් 06 ක් සමත් වී තිබිය යුතුය. පුරප්පාඩු පවතින මෝටර් රථ වර්ගයෙහි රියදුරු තනතුරුවල ස්වභාවය මත රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රය සහ නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය. මෝටර් රථ රියැදුරන් රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය. (JCB හා මෝටර් ග්‍රේඩර ක්‍රියාත්මක කිරීමට හැකි අයට ප්‍රමුඛස්ථානය දෙනු ලැබේ.) |
| 2 | විදුලි කාර්මික | 01 | රු. 25,250- 270 x 10 - 300 x 10 - 330 x 10 - 350 x 10 - රු. 38,450 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 ක් සමත්වී තිබිය යුතුය. අදාළ තනතුරට නියමිත පරිදි තෘතීය හා වෙනත් වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන් හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුනතාවක් ලබා තිබීම අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |
| 3. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 01 | රු. 24,250- 250 x 10 - 270 x 10 - 300 x 10 - 330 x 12- රු. 36,410 | 8 වැනි ශ්‍රේණිය (09 වසරට) සමත්ව තිබීම. |
| 4. | සෞඛ්‍ය කම්කරු | 01 | රු. 24,250-250 x 10 - 270 x 10 - 300 x 10 - 330 x 12- රු. 36,410 | 8 වැනි ශ්‍රේණිය (09 වසරට) සමත්ව තිබීම. |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

1. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
2. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.
3. * රියදුරු තනතුර සඳහා - අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන අවසාන දිනට දකුණු පළාත්සභා බල ප්‍රදේශය තුළ පූර්වාසන්න වසර 05 ක හා අනුගාමී වසර 03 ක පදිංචිය සනාථ කළ යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතු ය.)

   * අනෙකුත් තනතුරු සඳහා - අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන අවසාන දිනට දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ වසර 03 ක පදිංචිය සනාථ කළ යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.) (ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ට විශේෂත්වයක් දක්වනු ලැබේ.)

4. අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුයි.
6. සභාවේ දැනට ස්ථිර, තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සහ කුලී පදනම මත සේවය කරන සේවකයින් සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
7. අයදුම්කරුවන් ඒ ඒ තනතුරු ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

3.1. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

3.2. පත්වීම අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වන්නේ ය.

ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, මෙම සභාවේ හෝ දකුණු පළාතේ, පළාත් සභාව හෝ රජය විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට අනුකූලව කටයුතු කිරීමටත් යටත් වනු ඇත.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

01. අවශ්‍යතාවය අනුව ලිඛිත/ව්‍යුහගත/ප්‍රායෝගික හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු අය තෝරා ගැනේ.

02. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය:

- උප්පැන්න සහතිකය;
- අධ්‍යාපන සහතිකය;
- පදිංචිය සනාථ කිරීමේ සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ යුතු වේ.);
- මෑතක දී ලබා ගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිලධාරීගෙන් විය යුතුය.);
- වෙනත් සුදුසුකම් හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

06. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :-*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර 2019 අප්‍රේල් මස 01 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ සභාපති, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව, නව නගරය, ලුණුගම්වෙහෙර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුරු පැහැදිලිව සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමේ දී හෝ කැඳවන අතරතුරු කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල ප්‍රාදේශීය සභාවේ සභාපති සතුවේ.

ටී. එම්. රසික දිනේෂ්,
සභාපති,
ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ.......................................... තනතුරු සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————————

02. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————

03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————

04. ස්ථිර ලිපිනය:——————————

05. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————

06. විවාහක/අවිවාහක බව :——————————

07. (i) උපන් දිනය : අවුරුද්ද :—————— මාසය:—————— දිනය:——————

(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවු. :—————— මාස :—————— දින:——————

08. ජාතික හැඳුනුම්පත් අංකය :——————————

09. ජාතිය :——————————

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන් ද යන්න :——————————

11. ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි වසර ගණන :——————————

12. අධ්‍යාපන සුදුසුකම් :——————————

13. පළපුරුද්ද සහ වෙනත් සුදුසුකම්:——————————

14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය සහ විස්තර :——————————

15. එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. ඉහත සඳහන් තොරතුරුවලින් කිසිවක් සාවද්‍ය බව ඔප්පු වුවහොත් මා නුසුදුස්සෙකු කරනු ලැබීමටත් පත් කරනු ලැබීමෙන් පසු ඒ බැව් ඔප්පු වුවහොත් කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමටත් යටත් වන බව මම දනිමි.

——————————,

අයදුම්කරුගේ අත්සන.

දිනය:——————

02-205

සංශෝධනයයි

**ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය, අර්ධ ශිල්පීය, ශිල්පීය නොවන තනතුරු සඳහා බඳවා ගැනීම**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති තනතුරුවලට බඳවා ගැනීම සම්බන්ධයෙන් 2019.01.18 දින අංක 2107 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදන අංක 01-403 හි කාර්යාල කාර්යය සහායක තනතුරු 03 ක් ලෙස වැරදීමකින් සටහන් කර ඇති අතර, එය කාර්යාල කාර්යය සහායක තනතුරු 02 ක් ලෙස සංශෝධනය විය යුතුය.

තව ද, අයදුම්පත්‍ර කැඳවීමේ අවසන් දිනය වූ 2019.02.01, 2019.02.28 දක්වා දීර්ඝ කරනු ලැබේ.

ඒ. ප්‍රියදර්ශිනි,
ලේකම්,
නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව,
පුලියාවත්ත.

02-477

# පළාත් පාලන නිවේදන

**මාතලේ මහා නගර සභාව**

2019 වර්ෂයේ මස් පිණිස සතුන් මැරීම හා මස් වෙළෙඳාම තහනම් කර ඇති දිනයන්

ගෝ ඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 17(1) දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මාතලේ මහා නගර සභාවේ නගරාධිපති ඩල්ජිත් අලුවිහාරේ වන මම, පහත දැක්වෙන උපලේඛනයන් හි සඳහන් මධ්‍යම රජය හා මහා නගර සභාව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන විශේෂ දිනයන්හි දී මාතලේ මහා නගර සීමාවේ මස් පිණිස සතුන් මැරීම සහ වෙළෙඳාම් කිරීම තහනම් කරමි.

ඩල්ජිත් අලුවිහාරේ,
නගරාධිපති,
මහා නගර සභාව,
මාතලේ.

2017 දෙසැම්බර් මස 26 වැනි දින,
මාතලේ මහා නගර සභා කාර්යාලයේ දී ය.

**2019 වර්ෂයේ මස් පිණිස සතුන් මැරීම හා මස් වෙළෙඳාම තහනම් කර ඇති දිනයන්**

***උපලේඛන අංක 01***

| | | |
|---|---|---|
| ජනවාරි 20 ඉරිදා | - | දුරුතු පුර පසළොස්වක පොහොය දිනය |
| පෙබරවාරි 19 අඟහරුවාදා | - | නවම් පුර පසළොස්වක පොහොය දිනය |
| මාර්තු 20 බදාදා | - | මැදින් පුර පසළොස්වක පොහොය දිනය |
| අප්‍රේල් 19 සිකුරාදා | - | බක් පුර පසළොස්වක පොහොය දිනය |
| මැයි 18 සෙනසුරාදා | - | වෙසක් පුර පසළොස්වක පොහොය දිනය |
| ජූනි 16 ඉරිදා | - | පොසොන් පුර පසළොස්වක පොහොය දිනය |

| | | |
|---|---|---|
| ජූලි 16 අඟහරුවාදා | - | ඇසළ පුර පසළොස්වක පොහොය දිනය |
| අගෝස්තු 14 බදාදා | - | නිකිණි පුර පසළොස්වක පොහොය දිනය |
| සැප්තැම්බර් 13 සිකුරාදා | - | බිනර පුර පසළොස්වක පොහොය දිනය |
| ඔක්තෝබර් 13 ඉරිදා | - | වප් පුර පසළොස්වක පොහොය දිනය |
| නොවැම්බර් 12 අඟහරුවාදා | - | ඉල් පුර පසළොස්වක පොහොය දිනය |
| දෙසැම්බර් 11 බදාදා | - | උඳුවප් පුර පසළොස්වක පොහොය දිනය |

*උපලේඛන 02*

| | | |
|---|---|---|
| ජනවාරි 15 අඟහරුවාදා | - | දෙමළ තෛයිපොංගල් දිනය |
| පෙබරවාරි 04 සඳුදා | - | ජාතික දිනය |
| පෙබරවාරි 19 අඟහරුවාදා | - | තේරු උත්සවය |
| මාර්තු 04 සඳුදා | - | මහා ශිව රාත්‍රි දිනය |
| මැයි 19 ඉරිදා | - | වෙසක් පුර පසළොස්වක පොහොයට පසු දිනය |
| ඔක්තෝබර් 04 සිකුරාදා | - | ලෝක සත්ත්ව දිනය |

02-56

---

## වරකාපොල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) සහ (2) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව සබරගමු පළාත් සභාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල ප්‍රාදේශීය සභාව මඟින් 2018.09.04 වන දින පැවති මාසික මහා සභා රැස්වීමේ තීරණ අංක ඉ-04 යටතේ සභා සම්මත වී ඇත. ඒ අනුව මෙහි පහත දක්වා ඇති සහ ලේඛණවල විස්තර වන මාර්ග වරකාපොල ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබීමට සුදුසු බව තීරණය කරණු ලැබීය. ඒ අනුව පහත උපලේඛනවල සඳහන් මාර්ග නාම ලේඛණය වරකාපොල ප්‍රාදේශීය සභාව සතු මාර්ග බවට ප්‍රාදේශීය සභා පනතේ 24(1) වැනි වගන්තිය ප්‍රකාරව 2018.11.09 වන දින සබරගමු පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබාගෙන ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ ජනතාව මඟින් හෝ මෙම මාර්ගවලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පර්ශවය විසින් හෝ යම් විරුද්ධත්වයක් පල කරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පල වූ දින සිට තුන් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 24 (1) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුනහොත්, මෙහි සඳහන් හා එකී උපලේඛණවල විස්තර වන මාර්ග වරකාපොල ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එන්. සරත් සුමනසූරිය,
සභාපති.
වරකාපොල ප්‍රාදේශීය සභාව.

01. ග්‍රාම නිළධාරී වසම :- 82, මංගෙදර වසම
ගම :- මංගෙදර
පාරේ නම :- මාරාව මාර්ගය
පාරේ දිග :- මීටර් 79, පළල :- මීටර් 1-9
ආරම්භක ස්ථානය :- බටගොල්ල වත්ත අසල බෝක්කුව
අවසන් වන ස්ථානය :- මාරාව වත්ත අසල බෝක්කුව

පාරේ මායිම් :-

| වම් පැත්ත | දකුණු පැත්ත |
|---|---|
| ඇළ මාර්ගය | ඒ. එස් විමලසිරිට අයත් මාරාව කුඹුර |
| | ඒ. එස් සෝමසිරිට අයත් මාරාව කුඹුර |

02. ග්‍රාම නිළධාරී වසම :- 78, රාගල්කන්ද වසම
ගම :- රාගල්කන්ද
පාරේ නම :- මීගහලන්ද මාර්ගය
පාරේ දිග :- මීටර් 60,
ආරම්භක ස්ථානය :- බටේ ජනපදය සිට පස්පොලකන්ද පාසල් හංදියට යන මාර්ගයේ හැල්දෙණිය මාර්ගය
අවසන් වන ස්ථානය :- සුහරත් මැණිකේගේ වත්ත මායිම
පාරේ මායිම් :-

| වම් පැත්ත | දකුණු පැත්ත |
|---|---|
| ජේ. ටී. සෝමාවති මියට අයත් මීගහලන්ද වත්ත ඉඩම | එම්.එම්.ඩී.ආර්.ආර් මහීපාල මියට අයත් කැන්දගොල්ල වත්ත |
| | එම්.එම්.ඩී.එස් මහීපාල මයාට අයත් කැන්දගොල්ල වත්ත |

03. ග්‍රාම නිළධාරී වසම :- 94 බී, නිවටුව වසම
ගම : පහළ වැලිගල්ල, කොස්නාවල
පාරේ නම :- පහළ වැලිගල්ල, කොස්නාවල මාර්ගය
පාරේ දිග :- කිලෝ මීටර් 2.1, පළල අඩි :- 18
ආරම්භක ස්ථානය :- ගණිතපුර පන්දෙනිය මාර්ගයේ කි.මී 1 කණුව අසල හන්දිය
අවසන් වන ස්ථානය :- නිවටුව කොන්ගොඩට දිවෙන ප්‍රාදේශීය සභා මාර්ගය පාරේ මායිම් :-

| වම් පැත්ත | දකුණු පැත්ත |
|---|---|
| ඩී. නිමල් සුරවීරට අයත් අක්කර 20 රබර් ඉඩම | ඩබ්ලිව්. ප්‍රේමචන්ද්‍ර වර්ණපුරට අයත් ඇටිනාවත්ත |
| බී. ජී. පියදාසට අයත් ඇටිනාවත්ත | කේ. එස්. විමලරත්නට අයත් ඇටිනාවත්ත |
| ඩී. නිමල් සුරවීරට අයත් ගෙවත්ත | පී. එච්. විලියම්ට අයත් කුඹුර |
| කේ. අනුරුද්ධ පුෂ්ප කුමාරට අයත් පොල්ගහමුල කුඹුර | ඇළ |
| පී. එච්. කිරිනේරිස්ට අයත් මීගහමුල කුඹුර | ඇළ |
| පී. එච්. අනුර චිත්‍රානන්දට අයත් දඹුගොල්ල අස්වැද්දුම | ඇළ |
| බී. සුනිල් ජයරත්නට අයත් පන්ගොල්ලහේන අස්සැද්දුම | ඇළ |
| පී. එච්. විජිතට අයත් නින්ද කුඹුර | ඇළ |
| කමත | ඇළ |
| ජී.ආර් මාලනීට අයත් සියඹලාගහමුල කනටි | ඇළ |
| පී.එච්. සිරිපාලට සහ තවත් අයට අයත් ඉහළ පංගුව (අඹගහ කුඹුර) | බී. ජී. ජේම්ස්ට සහ තවත් අයට අයත් පතහගාව කුඹුර |

## යටිනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර, මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වලින් කොටසක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත් අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර, ක්‍රියා කරන ලෙසට දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ආර්. එන්.කේ. රූපස්සර,
සභාපති,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

යටිනුවර ප්‍රාදේශීය සභාව.
ඇඹිල්මීගම,
පිළිමතලාව.

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *ග්‍රාම නිලධාරී වසම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය* | *වම් පැත්ත* | *දකුණු පැත්ත* | *දිග* | *පළල* | *පිඹුරු පත් අංකය* |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | දියපලාගොඩ තැන්නේවත්ත මල්ගම්මන පල්කඩේ කුඹුර හරහා මහකුඹුර දක්වා මාර්ගය | මල්ගම්මන | දියපලාගොඩ තැන්නවත්ත | මල්ගම්මන මල්ගොතන පිටිය | එස්. එම්. බණ්ඩාර මැණිකේ<br>ඩබ්. එම්. යූ. වීරසුන්දර<br>ඩබ්. එම්. ටිකිරි බණ්ඩා<br>එස්. එම්. සෙනෙවිරත්න<br>ජී. එම්. අබේරත්න බණ්ඩා<br>යූ. එන්. සිරිවර්ධන<br>එස්. එම්. ගුණරත්න | එස්. එම්. බණ්ඩාර මැණිකේ<br>චිත්‍රා ජයසූරිය<br>ඩබ්. එම්. සෙනෙවිරත්න<br>අයි. ජී. රත්නායක,<br>ඩබ්. එම්. එස්. සෝමාවතී<br>ටී. බී. වික්‍රමආරච්චි<br>ටී. ඩබ්. සුබසිරි<br>ඩබ්. එම්. ඩිංගිරි බණ්ඩා<br>පී. බී. වාසුන්දර<br>එස්. එම්. සෙනෙවිරත්න<br>ඩබ්. එම්. විජේබණ්ඩා<br>එස්. එම්. සෙනෙවිරත්න | කිලෝ මීටර් 01 | මීටර් 2.43 | 4890 |

02-179

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජුරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2019 වර්ෂය** | | | |
| **පෙබරවාරි** | 2019.02.01 | සිකුරාදා | 2019.01.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.08 | සිකුරාදා | 2019.01.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.15 | සිකුරාදා | 2019.02.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.22 | සිකුරාදා | 2019.02.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2019.03.01 | සිකුරාදා | 2019.02.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.03.08 | සිකුරාදා | 2019.02.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.03.15 | සිකුරාදා | 2019.03.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.03.22 | සිකුරාදා | 2019.03.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.03.29 | සිකුරාදා | 2019.03.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2019.04.05 | සිකුරාදා | 2019.03.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.04.12 | සිකුරාදා | 2019.03.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.04.18 | බ්‍රහස්පතින්දා | 2019.04.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.04.26 | සිකුරාදා | 2019.04.12 | සිකුරාදා | දහවල් | 12.002 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.